# තීරණය

මෙරට දේශපාලන තත්වය කෙතරම් අස්ථායී දැයි කිවහොත් සෑම සතියක් ම තීරණාත්මක සතියක් වෙයි. ලබන සතිය ද තීරණාත්මක සතියකි. එහෙත් ලබන සතිය ඉතා වැදගත් යැයි බොහෝ දෙනකුට සිතෙනු ඇත. එසේ සිතෙන්නේ ආණ්ඩුවේ අනාගතය පිළිබඳව පාර්ලිමේන්තුවේ ඡන්දයක් පැවැත්වෙන බැවිනි. ඒ ඡන්දයේ ප්‍රතිඵලය සියල්ලන්ට ම දැනගත හැකි ය. එබැවින් ඒ සම්බන්ධයෙන් බොහෝ දෙනාගේ උනන්දුවක් වෙයි. එවැනි කාහටත් දැනගත හැකි ප්‍රතිඵලයක් සහිත ඡන්දයක් තිබුණත් නැතත් සෑම සතියක් ම තීරණාත්මක සතියක් වෙයි.

එයට හේතුව මෙරට ජාතික විජාතික බලවේග අතර අරගලය තවමත් නිම නොවී තිබීම ය. මේ ආණ්ඩුව ජාතික බලවේග විසින් පිහිටුවාගනු ලැබුවක් වෙයි. ඒ නිසා ම ආණ්ඩුව පිහිටුවනු ලැබූ දිනයේ සිට ම විජාතික බලවේග ඒ පෙරළා දැමීමේ අරමුණින් එයට විරුද්ධව කටයුතු කරනු දක්නට හැකි ය. විජාතික බලවේගවලට අයත්වන්නේ ඇතැම් බටහිර විදේශීය රටවල් පමණක් නො වෙයි. එ ජා පක්ෂය, කොටි සංවිධානය හා එහි පාර්ලිමේන්තු නියෝජිතයා වූ දෙමළ ජාතික සංධානය, බොහෝ ක්‍රිස්තියානි පල්ලිවල හා කතෝලික පල්ලියේ නායක පූජකවරු, බටහිර මුදලින් යැපෙන රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, එලෙස ම බටහිර මුදලින් යැපෙන ඇතැම් මාක්ස්වාදී පක්ෂ, ජනමාධ්‍ය හා උගත්තු, බටහිර මතවාදවලින් යැපෙන ජනමාධ්‍ය, උගත්තු හා දේශපාලන පක්ෂ, සහ තවත් අය විජාතික බලවේගවලට අයත් වෙති.

බටහිර රටවලින් යැපෙන ඊනියා හොඳ රාජ්‍ය නොවන සංවිධාන ඇතැයි මම නො සිතමි. බටහිර රටවලින් සෘජුව හෝ වක්‍රව හෝ යැපෙන රාජ්‍ය නොවන සංවිධාන සියල්ලක් ම අවසාන විග්‍රහයෙහි දී බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් පෙනී සිටියි. මේ ඇතැම් සංවිධානයක් දේශීයත්වය වෙනුවෙන් පෙනී සිටිනවා විය හැකි ය. එහෙත් ඒ බටහිරයන්ගේ උපක්‍රමයක් පමණකි. බටහිරින් යැපෙන සියළු රාජ්‍ය නොවන සංවිධාන එක් මතයක් වෙනුවෙන් පෙනී සිටිනවා වෙනුවට බටහිරයෝ සංවිධාන කිහිපයකට වෙනත් මතයක් (දේශීය වූ මතයක්) වෙනුවෙන් පෙනී සිටීමට ඉඩ සලසති. බටහිරයෝ එමඟින් තමන්ට එල්ලවිය හැකි චෝදනා මගහැරීමට උත්සාහ දරති. බටහිරින් යැපෙන රාජ්‍ය නොවන සංවිධාන යනු බටහිරයන් විසින් අපේ රටවල ජනමතය ඔවුන්ට අවශ්‍ය ආකාරයට සකස්කිරීම සඳහා පිහිටුවා ගනු ලැබ ඇති ආයතන වෙයි. එක්තරා අන්දමකින් එදා විවිධ පල්ලි මගින් බටහිරට, එනම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට, කරන ලද සේවය අද බටහිරින් යැපෙන රාජ්‍ය නොවන සංවිධාන මගින් කෙරෙයි.

බයිලා කතුවරයා ලංකාව විසින් 1848න් පසු කරන ලද නිදහස් සටනක් නැතැයි කියන නමුත් අදත් ආසියාවේ බටහිර රටවලට එරෙහිව නිදහස් අරගලයෙහි යෙදෙන රටවල් වනුයේ ලංකාව ප්‍රධාන බොහෝ ථෙරවාදී රටවල් ය. ඉන්දියාව විසින් කරන ලදැයි කියන නිදහස් සටන අද වන විට පරාජය වී ඇත. මහත්මා ගාන්ධිගේ ප්‍රධානත්වයෙන් ගෙන යන ලද නිදහස් සටන ගැන නැවත අධ්‍යයනයක් කිරීම අවශ්‍ය වෙයි. (මේ විලාසිතාවක් වී ඇති ඊනියා නැවත කියවීමක් නොව අපට සාපේක්ෂව අපේ ප්‍රවාද ඔස්සේ ඉන්දීය නිදහස් සටන යැයි කියැවෙන්න පිළිබඳ කෙරෙන අධ්‍යයනයකි. නැවත කියවන අයට සිදුවනු ඇත්තේ පශ්චාත්නූතනවාදී මනස්ගාත ඇතුළු ඇතැම් දේ නැවත නැවත කියව කියවා සිටීම පමණකි. කිසිම නිර්මාණාත්මක හැකියාවක් නැති ඔවුහු නැවත කියවන්නෝ ම පමණක් වෙති.) මහත්මා ගාන්ධි වෙනුවෙන් මුද්දරයක් නිකුත්කිරීමට බ්‍රිතානීන් කටයුතු කෙළේ ඔහු ඉන්දියාව බ්‍රිතානි යටත්විජිතවාදයෙන් නිදහස් කරගත් බැවින් ද? නැතහොත් ඔහුගේ ක්‍රියා මාර්ගය නිසා බ්‍රිතානියේ සිට ම ඉන්දීය නායකයන් ලවා ඉන්දියාව පාලනය කිරීමට ක්‍රමවේදයක් සකස්කර ගැනීමට බ්‍රිතානියට හැකි වූ බැවින් ද? බ්‍රිතානීන් තම සැබෑ විරුද්ධවාදීන්ට සලකන්නේ කෙසේ ද යන්න අමුතුවෙන් කිවයුතු නො වේ.

ඒ කුමක් වුවත් ඉන්දියාවේ ප්‍රභූන් අතර බටහිර මතවාද ජයග්‍රහණය කර තිබේ. හෙට ඉන්දියාව සමහරවිට ආර්ථික යෝධයකු වීමට ඉඩ ඇත. එහෙත් ඉන්දියාව බටහිර මතවාද, ප්‍රවාද සංකල්ප පසුපස යන ආධ්‍යාත්මික දීනයකු බවට පත්වනු ඇත. ඉන්දියාවේ බටහිර අධ්‍යාපනයක් ලැබූ පිරිස සමස්ත ජනගහණයෙහ් ප්‍රතිශතයක් ලෙස ගත්කල සුළු වුව ද සංඛ්‍යාත්මක ව ගත්කල විශාල ය. ඔවුහු ඉන්දියාවේ ජනමතය හසුරුවති. බටහිර ප්‍රවාදවල ආධිපත්‍යය ගැන යම් තේරුමක් ඇති අය ද කරන්නේ පැරණි භාරතයේ දැනුම ගැන සොයා වැලීම, අධ්‍යයනය කිරීම පමණකි. ඒ දැනුම හා

© Prof. Nalin De Silva

සංස්කෘතිය පදනම් කරගනිමින් බටහිර දැනුමට අභියෝගාත්මක ව නව දැනුමක් ගොඩනගන්නේ කෙසේ ද යන්න ගැන ඔවුන් සිතා බලාවත් නැත. කලකට පෙර ජනතා මිතුරෝ නම් සංවිධානයේ නායකයකු ජනතා විමුක්ති පෙරමුණ දංගෙඩියට යැවීම තම කාර්යභාරය කරගත් ඊනියා උගතකුගේ උපකාරයෙන් ඉන්දියාවට ගොස් පැමිණ අපට චෝදනාත්මකව පැවසුවේ අප සිංහල ගණිතයක් ගැන කතාකරමින් සිටින බවත් ඒ අතර ඉන්දිය විද්‍යාඥයන් හා ගණිතඥයන් පැරණි භාරතයේ තිබූ දැනුම අධ්‍යයනය කරන බවත් ය.

මොහුට තේරුම්ගැනීමට නොහැකි වූ කරුණ වූයේ අපේ අවශ්‍යතාව ඒ පැරණි දැනුම අධ්‍යයනය කර බටහිරයන්ගේ ප්‍රයෝජනය සඳහා ඒ ඉංගිරිසියෙන් ලේඛනගත කිරීම නොව අපේ දැනමේ පදනම අවබෝධ කරගෙන නව දැනුමක් නිර්මාණය කිරීම බව ය. අර දංගෙඩි යවන්නාට එදා අවශ්‍ය වූයේ ද දැනටත් අවශ්‍ය වන්නේ ද අපේ පැරණි දැනුම බටහිරයන්ගේ ප්‍රයෝජනය සඳහා ලේඛනගතකිරීම ය. ඔහුත් ඔහුගේ භාර්යාවත් ජාතික බලවේග සමග සිටින බව පෙන්වුව ද ඔවුහු විජාතික බලවේගයෙහි නියෝජිතයෝම පමණක් වෙති. මියන්මාරයේ ආණ්ඩුවට විරුද්ධව භික්ෂූන් වහන්සේ නැගිටීම පිටුපස ඇති බටහිර බලවේග ගැන කරුණු සාධක ඇතිව ලියා තිබියදීත් ඔවුන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ආරක්ෂා කරමින් කියා සිටින්නේ ඒ නැගිටීම් ස්වේච්ඡාවෙන් හිටි අඩියේ සිදු වූ බව ය.

ඒ කුමක් වුවත් ඉන්දියානුවන් පිරිසක් පැරණි භාරතයේ තිබූ දැනුම ගැන අධ්‍යයනය කළත් ඉන්දියාවේ ප්‍රභූන් හා මධ්‍යම පන්තිය බටහිර මතවාදී ආධිපත්‍යයට යට වී අවසාන ය. පැරණි භාරතයේ දැනුම ගැන කතාකරන පිරිස කුමක් කීවත් බටහිර මතවාද අද ඉන්දීය මධ්‍යම පන්තියේ ද මතවාද බවට පත් වී ඇත. වත්මන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සන්දර්භයෙහි නිදහස යනු අන් කිසිවක් නොව බටහිර මතවාද, ප්‍රවාද සංකල්ප ආදියෙන් නිදහස් වීම ය. ඒ අරුතින් ගත්කල අද ඉන්දියාව නිදහස් නො වේ. එහි විජාතික බලවේග ජයග්‍රහණය කර අවසන් ය. අවුරුදු තුන්දහසකට පෙර දඹදිව ආක්‍රමණය කළ ආර්යයන්ගේ වෛදික මතවාදවලින් එරට ගලවා හත්තේ බුදුන් වහන්සේ ය. වර්තමානයෙහි ඇතැමුන් බුදුන් වහන්සේ හා මහත්මා ගාන්ධි ඉන්දියාවෙන් (දඹදිවින්, භාරතයෙන්) බිහි වූ ශ්‍රේෂ්ඨතම පුරුෂයන් ලෙස සැලකුව ද ගාන්ධිතුමාට ඉන්දියාව බටහිර මතවාදවලින් ගලවාගැනීමට නො හැකි විය.

එක් අතෙකින් බැලූ කල කොටි සංවිධානය විසින් අපට නිදහසේ මාවත විවෘත කරදෙනු ලැබ ඇත. අද මෙරට මධ්‍යම පන්තිය  බටහිරයන් කොටින්ට ආධාර කරන ආකාරය ද බටහිර මතවාද, ප්‍රවාද සංකල්ප මගින් කොටි සංවිධානය පවත්වාගෙන යන ආකාරය ද  ක්‍රමයෙන් අවබෝධ කරගනිමින් සිටියි. බටහිරයන් හා ඔවුන්ගේ රාජ්‍ය නොවන සේවක, මාක්ස්වාදී, ඇතැම් ක්‍රිස්තියානි කතෝලික පූජක හා ඇතැම් විශ්වවිද්‍යාල කථිකාචාර්ය බත් බැළයන් නොවන්නට කොටි සංවිධානය දැනටමත් පැරදී අවසන් ය. එහෙත් සියළු ආකාරයේ විජාතික බලවේග කොටි ආරක්ෂා කරයි. අද මේ ආණ්ඩුව පෙරළා දැමීමට මේ සියළු බලවේග එකතු වී ඇත. ඔවුන්ට අවශ්‍ය එනිල් වික්‍රමසිංහ මහතාගේ හා සම්බන්ධන්ගේ ආණ්ඩුවක් රවි කරුණානායකලා හරහා පිහිටුවීමට ය. රවි කරුණානායක මහතා සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ ආණ්ඩුවට විරුද්ධව 1962 දී කතෝලික හා ක්‍රිස්තියානි යුද හමුදා හා පොලිස් නිලධාරීන්ගේ කුමන්ත්‍රණයක් මෙහෙය වූ සී සී දිසානායක මහතාගේ මුණුබුරකු බව බොහෝ දෙනා නො දනිති.  බටහිර රටවල තානාපතිවරු එ ජා ප ඉහළම නායකයන්ගේ නිවෙස්වල පාන්දර දෙක වන තුරු සිටින්නේ ශේක්ස්පියර් ගැන අධ්‍යයනයක් කරමින් නො වේ.

මෙරට ජාතික හා විජාතික බලවේග අතර සටන අද ඉහළම තලයකට පැමිණ ඇත. ඒ සටන පාර්ලිමේන්තුවේ මෙන් ම ඉන් පිටත ද සිදු කෙරෙයි. සෑම සතියක් පාසාම දිනක් පාසාම ඒ සටන කෙරෙයි. රටේ අනාගතය තීරණය වන්නේ මේ සරනින් ය. මේ සතියේ පාර්ලිමේන්තුවේ දී ආණ්ඩුව පෙරළා දැමීමේ වෑයමක් වෙයි. එහි දී වත්මන් ආණ්ඩුව පරදා රනිල් - සම්බන්ධන් (ප්‍රභාකරන්) ආණ්ඩුවක් පිහිටුවීමේ සුළු ඉඩක් තිබේ නම් තොණ්ඩමන් හා හකීම් ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පිල් මාරුකරනු ඇත. යම් අයුරකින් එවැනි පිල් මාරුවක් වී ජ වි පෙ ඡන්දය හේතුකොටගෙන ආණ්ඩුව පෙරළුණහොත් ජාතික බලවේග දශක කිහිපයකින් පස්සට යනු ඇත. ආණ්ඩුව පවත්වාගෙන ගොස් කොටි සමූලඝාතනය කිරීම මෙරට ජාතික බලවේගයේ අපේක්ෂාව වෙයි. ජ වි පෙ ඒ අපේක්ෂාවට ඉඩ නොදී තමන් බලයට පත්වීමේ සිහිනය දකින්නේ නම් ඒ සිහිනයක් ම වන බවට ජනතාව වග බලාහනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva